" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා අප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary } දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599; ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601; ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk

සාමාන්‍ය දුරකථන / பொதுத் தொலைபேசி / General Telephone } 011 - 2093000

ISO 9001 · SLAB ACCREDITED · ISO/IEC: 17021 QMS-001-01

(52)

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/01-2022 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2022.06. ~~21~~ |
|---|---|---|---|---|---|

පාලන චක්‍රලේඛ අංක 07/2022

ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප.).
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය(බ.ප.).

**කර්මාන්ත දෙපාර්තමේන්තුවේ නිෂ්පාදනයන්ට අදාල පළාත් සභා ආයතන වල ඇණවුම් කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් සැපයීම**

කර්මාන්ත දෙපාර්තමේන්තුවේ සම්ප්‍රදායික කර්මාන්තකරුවන් දිරිගැන්වීම සහ පළාත් සභාවේ මුදල් වෙනත් බාහිර ආයතන වලට ගලා යාමෙන් පළාත් සභාවට අහිමිවන ආදායම් නැවත පළාත් සභාව තුළම රඳවාගෙන ඒ තුළින් බස්නාහිර පළාතේ කුඩා කර්මාන්ත හා පේෂ කර්මාන්තකරුවන්ගේ ආර්ථික තත්ත්වය ඉහල නංවාලීමට මෙන්ම කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ආදායම් තත්ත්වය ඉහළ නංවාලීම අරමුණු කර ගනිමින් බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ නිෂ්පාදනයන්ට අදාල පළාත් සභා ආයතන වල ඇණවුම් සියල්ල කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් මිලදී ගැනීම සඳහා ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/07/CD හා 2021.12.15 දිනැති ලිපිය මගින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාදී ඇත.

02. ඒ අනුව නියමු ව්‍යාපෘතියක් වශයෙන් බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය හා අධ්‍යාපන අමාත්‍යාංශ යටතේ ඇති සියලුම දෙපාර්තමේන්තු හා ආයතන වෙත මෙම නිෂ්පාදන ලබා දීමට තීරණය කර ඇති අතර කර්මාන්ත දෙපාර්තමේන්තුව මගින් නිපදවනු ලබන නිෂ්පාදන පහත පරිදි වේ.

- සර්ජන් ගවුම් (S,M,L,XL) – විවිධ වර්ණ (නිල් , කොළ)
- මසන ලද ඇඳ රෙදි කට්ටල සහ ඇඳ රෙදි රෝල් - ( සුදු ,අමු , නිල් )
- රෝහල් සඳහා අවශ්‍ය වන විවිධ රෙදි - (කොල , නිල් , සුදු රෙදි )
- කොට්ට උර රෝල් සහ මසා නිම කළ කොට්ට උර
- රෝහල් තිර රෙදි (දෙපාර්තමේන්තු නිලධාරීන් පැමිණ මිණුම් ගෙන,සාම්පල් තේරීමෙන් පසු මහර මැහුම් අංශයේ තිර මැසීම සිදු කරනු ලබයි)
- ස්ක්‍රීන් තිර / සර්ජන් කලිසම සහ කමිසය
- ඩස්ටර් රෙදි , ඩස්ටර් සහ රෝහල් කොටු රෙදි
- ආයුර්වේද සම්භාන ආයතන සඳහා අත් තුවා සහ නාන තුවා
- තිර රෙදි 60,72 ,54, පළල (තනි පාට,ඉරි සහිත,කොටු සහිත,අමු පාට ,සුදු පාට)
- සාරි ( සාමාන්‍ය කපු සාරි, මල්බාන ලද කපු සාරි , රෙයෝන් සාරි ,මල් බාන ලද රෙයෝන් සාරි , ෂේඩඩ් කපු සාරි , ෂේඩඩ් රෙයෝන් සාරි , පල්ලු සාරි , දුම්බර රටා මිශ්‍ර කපු සාරි ,නිල ඇඳුම් සාරි)
- ඇඳුම් රෙදි (සුදු රෙදි , කොටු රෙදි , තනි වර්ණ, දික් ඉරි , හරස් ඉරි , රෙයෝන් නූල් භාවිතයෙන් , සුදු කමිස රෙදි)
- සරොම් රෙදි , සරොම් /වුල් තුවා /ජී.එස් තුවා / හනිකොම් තුවා රෙදි රෝල් සහ තුවා වශයෙන්
- අමු රෙදි/සුදු තිර රෙදි /ඩස්ටර් රෙදි / ඩස්ටර් /72" පළල රෙදි
- ඇඳ රෙදි (54",72",80",108" X 94") රෝල් සහ ඇඳ රෙදි කට්ටල
- මේස රෙදි (කොටු , ශත පහ මෝස්තරය , කුකුල් අඩි මෝස්තරය ) සහ මසා නිම කළ මේස රෙදි

- සාටක ( කපු , රෙයෝන්) / කාපට් / ස්ටූල් කවර / බුමුතුරුණු
- ටසල් /දුම්බර රෙදි /ටේබල් මැට් කට්ටල/ කොට්ට උර රෝල් සහ මසා නිම කළ කොට්ට උර
- බෑග් සඳහා රෙදි සහ නිම කල බෑග් / කුෂන් කවර රෙදි සහ මසා නිම කළ කුෂන් කවර
- රෝහල් සඳහා අවශ්‍ය වන විවිධ රෙදි වර්ග - කොල , නිල් , සුදු රෙදි , ජී.එස් තුවා , සර්ජන් ගවුම
- අත්පිස්නා රෙදි රෝල් සහ මසා නිම කළ අත්පිස්නා
- කාන්තා නිමි ඇඳුම් (කුර්තා , ලුංගි, ගවුම් , සාය , බ්ලවුස් , කුර්තා රෙදි , සාරි රෙදි )
- පිරිමි නිමි ඇඳුම් (කමිස,සරම්)

03. බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති රෝහල් පද්ධතිය සහ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති කාර්යාල හා පාසැල් පද්ධතිය සඳහා අවශ්‍ය ඉහත ඇණවුම් සියල්ල කර්මාන්ත දෙපාර්තමේන්තුව මගින් ලබාදීමට හැකියාව පවතින අතර එම ක්‍රියාවලිය ඉටුකරලීම සඳහා අවශ්‍ය පහසුකම් හා නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම සඳහා බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව සතුව සියළු සම්පත් පවතින අතර එම පහසුකම් සපුරාලීම සඳහා බස්නාහිර පළාත තුළ කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ පහත සඳහන් අලෙවි මධ්‍යස්ථාන ස්ථාපනය කර ඇත.

- බත්තරමුල්ල
- පිළියන්දල
- මහර
- කටුනායක
- දියගම
- බියගම
- ගම්පහ
- අගලවත්ත
- ක්‍රාෆ්ට් ලංකා අලෙවි සැල් හා බස්නාහිර පළාත තුල පවත්වන ජංගම අලෙවිසැල්
- කඩවත
- කළුතරඋතුර
- කළුතරදකුණ
- ඒත්තුකාල
- හොරණ
- දෙදියවල
- නාගස්හන්දිය

04. ඒ අනුව ඔබ අමාත්‍යාංශය යටතේ ඇති සියලුම දෙපාර්තමේන්තු හා ආයතන (රෝහල්, ආයුර්වේද රෝහල්/අධ්‍යාපන කාර්යාල/පාසල් පද්ධතිය)දැනුවත් කරමින් ඉදිරියේදී ඉහත නිෂ්පාදන මිලදී ගැනීමට අදහස් කරන්නේ නම් බස්නාහිර කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් පමණක් මිලදී ගැනීමට කටයුතු කරන ලෙසත් නිෂ්පාදන හා සේවා ලබා ගැනීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සඳහා පහත සඳහන් නිලධාරීන් සම්බන්ධ කර ගන්නා ලෙසත් දැනුම් දෙමි.

ප්‍රධාන කාර්යාලය - කර්මාන්ත දෙපාර්තමේන්තුව,204,ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,බත්තරමුල්ල.
කර්මාන්ත අධ්‍යක්ෂ - 011-2092563
සහකාර අධ්‍යක්ෂ - 0112092587/0717059419
නිෂ්පාදන අංශ ප්‍රධානි - 0112092594/0707528404/0779528404

05. යම් හෙයකින් විශේෂ හේතුවක් මත/හදිසි අවස්ථාවකදී /ඉල්ලීමෙන් පසු දීර්ඝ කාලයක් ගත වන විට හෝ ඉටු කිරීමට අපහසු අවස්ථාවකදී පමණක් එම අවශ්‍යතාවය හේතු සහිතව පෙන්වා දෙමින් අදාල විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය මත විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් අවශ්‍ය මිලදී ගැනීම් වෙනත් ආයතනයකින් ඉටු කරවා ගැනීමේ හැකියාව පවතින බවද වැඩිදුරටත් අවධාරණය කරමි.

ජේ.එම්.සි.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

o/c 06/16

පිටපත්- 01.ආණ්ඩුකාර ලේකම් - කරු.දැ.ග.ස
02.ලේකම්,(කෘෂිකර්ම / පළාත් පාලන) අමාත්‍යාංශය.බ.ප. - කරු.දැ.ග.ස
03.පළාත් අධ්‍යක්ෂ,(සෞඛ්‍ය / අධ්‍යාපන) දෙපාර්තමේන්තුව.බ.ප. - කරු.දැ.ගැ.ස. හා අ.ක.ස.
04.අධ්‍යක්ෂ ,අභ්‍යන්තර විගණන - කරු.අ.ක.ස.